පිට්ටනිය

සුරංජන් වික්‍රමසිංහ

දේශපාලඥයෝ ක්‍රීඩකයන් ද බිළි ගනිති

අපේ මව් බිම ශ්‍රී ලංකාවේ විවිධ ක්‍රීඩා තිබේ. ක්‍රිකට්, වොලිබෝල්, මලල ක්‍රීඩා ආදී ක්‍රීඩා සිය ගණනක් ඒ අතර වෙයි. එම ක්‍රීඩා තුළින් පායා ආ තරු රැසක් වන අතර එම තරු මව් බිමේ නාමය ලෝකය නමැති අහස පුරා විහිදුවා තිබේ. ලෝකයට ශ්‍රී ලංකාවේ නම මෙසේ රැගෙන ගිය ක්‍රීඩා තරු හරහා දේශපාලන ජයග්‍රහණ ලබා ගැනීමට අපේ මව් බිමේ ඇතැම් දේශපාලන පක්ෂ උත්සාහ දරයි. මෙය කොතෙක් දුරට ගැලපෙනවාදැයි යන්න ප්‍රශ්නාර්ථයකි. කෙසේ වෙතත් බරපතල ලෙස සාකච්ඡා කළ යුතු තරමට ම එම තත්වය උග්‍ර වෙමින් පවතී. එබැවින් මෙවර අපි ක්‍රීඩා ලිපියෙන් කතා කරන්නට යන්නේ ක්‍රීඩකයන්ගේ දේශපාලන ආගමනය පිළිබඳවයි.

මෙරට දේශපාලනයට පිවිසි පළමුවන ජනප්‍රිය තලයේ ක්‍රීඩකයා ලෙස බොහෝ දෙනෙක් සිතන්නේ අර්ජුන රණතුංග පිළිබඳවයි. ලංකාවට ලෝක ක්‍රිකට් කිරුළ දිනා ගැනීමට දායක වූ අර්ජුන මෙරට ක්‍රීඩා ඉතිහාසය තුළ බිහි වූ අතිශය වැදගත් චරිත අතරිනුත් ඉහළ ස්ථානයක වැජඹේ.

> ''මට මේක අල්ලන්නෙ ම නෑ. ක්‍රිකට්වලට මොනව හරි හොඳ දෙයක් කරන්න ලැබෙනව නම් මම මේ ඇමතිකම් මන්ත්‍රීකම් සේරම පැත්තකට දාල ඒකට කැපවෙනව''
>
> අර්ජුන රණතුංග

කෙසේ වෙතත් දේශපාලනයට පිවිසි පළමුවන ක්‍රීඩකයා නම් අර්ජුන නොවේ. කලකට ඉහත ලංකාවේ සිටි දක්ෂ පාදග පන්දු යවන්නෙකු වූ දකුණු අප්‍රිකානු තහනම් සංචාරයක් හේතුවෙන් තරඟ දිවිය තහනමට ලක් වූ අජිත් ද සිල්වා මේ වන විට ද දකුණු පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකි. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරයකු වන ඔහු දේශපාලනය ආරම්භ කළේ අර්ජුනටත් කළිනි. කෙසේ වෙතත් අජිත් පළාත් සභා මන්ත්‍රීවරයකු වූයේ ක්‍රීඩාවෙන් ලබා ගත් ජනප්‍රියභාවය නිසා ම නොවේ. එබැවින් ඔහුගේ දේශපාලන මතුවීම පිළිබඳව එතරම් සාකච්ඡා නොවිණ.

අර්ජුනගේ මතුවීම සිදුවූයේ පැහැදිළිව ම ක්‍රීඩා ජනප්‍රියභාවය හරහාය. ඔහුගේ පියා රෙජී රණතුංග ශ්‍රීලනිපයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වූ අතර ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කළ ඇමතිවරයෙකු ද විය. කෙසේ වෙතත් අර්ජුන ආවේ පියාගේ බලකොටුවෙන් නොවේ. ඔහු තමන්ට ලැබුණු ජනප්‍රියභාවය හරහා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මන්ත්‍රීවරයෙකු වී පසුව නියෝජ්‍ය ඇමතිවරයෙකු බවට ද පත්වී සිටී. කෙසේ වෙතත් අර්ජුනගේ දේශපාලනය ඔහුගේ අවශ්‍යතාවය නිසා ම සිදුවූවක් යැයි කීම වැරදිය.

එදා 2001 එස්.බී ඇතුළු පිරිසගේ එජාප සම්ප්‍රාප්තිය නිසා හෙම්බත් වී සිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අලුත් ජවයක් අවශ්‍ය වී තිබිණි. ඔවුන් එම ජවය පුරවා ගැනීමට හැදුවේ අර්ජුන වැනි චරිත හරහා ය. අර්ජුනව බලහත්කාරයෙන් මෙන් දේශපාලනයට ඇද ගත්තේ මේ අනුව ය. කෙසේ වෙතත් අර්ජුන යනු කිසි දිනෙක දේශපාලනය බඩේ බැදගත්තෙකු නොවේ. ඔහු ඊයේ පෙරේදා දිනක ද මේ ලියුම්කරු සමඟ ප්‍රකාශ කළේ ''මට මේක අල්ලන්නෙ ම නෑ. ක්‍රිකට්වලට මොනව හරි හොඳ දෙයක් කරන්න ලැබෙනව නම් මම මේ ඇමතිකම් මන්ත්‍රීකම් සේරම පැත්තකට දාල ඒකට කැපවෙනව'' යනුවෙනි. දේශපාලනයට සම්බන්ධ වන්නට කොතරම් උත්සාහ දැරුව ද ක්‍රීඩකයන්ට එය එතරම් ගැලපෙන තැනක් නොවන බවට හොඳම උදාහරණය අර්ජුනගේ මෙම ප්‍රකාශයයි.

එසේ තිබිය දීත් ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ රැසක් දැන් දේශපාලනයට පිවිසෙන්නට කටයුතු කරමින් සිටිති. මෑතක දී ශ්‍රී ලංකාවේ හිටපු වේග පන්දු යවන්නෙකු වන ප්‍රමෝද්‍ය වික්‍රමසිංහ මාතර එජාප සංවිධායක ධුරය බාර ගත්තේ ය. දැන් ඔහු පළපුරුදු දේශපාලඥයෙකු වූ මංගල සමරවීර සමඟ ගැටමින් මාතර ආසනය එක්සත් ජාතික පක්ෂයට දිනා දීම සඳහා කටයුතු කරමින් සිටී. වාර්තා වන අන්දමට ළඟදී ම කැස්බෑව ආසනය නියෝජනය කරන පළපුරුදු දේශපාලඥයෙකු වන ගාමිණී ලොකුගේ ජාතික ලැයිස්තුවට යවා එම ආසනයේ සංවිධායක ධුරය ශ්‍රී ලංකා ටෙස්ට් ක්‍රිකට් පිලේ හිටපු නායක හෂාන් තිලකරත්නට ලබා දීමට එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය කටයුතු කරමින් සිටී.

මීට අමතරව ජනප්‍රිය මලල ක්‍රීඩිකා සුසන්තිකා ජයසිංහට කෑගල්ල දිස්ත්‍රික්කයේ සංවිධායක ධුරයක් ලබා දීමට එජාප නායකයන් කටයුතු කරමින් සිටී. සනත් ජයසූරිය දේශපාලනයට ගැනීමට එජාප නායකයන් යෝජනා කළ විට ඔහු පවසා ඇත්තේ තමාට තවමත් හොඳ හැටි ක්‍රිකට් සෙල්ලම් කිරීමට හැකි බැවින් දේශපාලනය කිරීමට කලබලයක් නැති බවයි. ඉදිරියේ දී ඒ ගැන සලකා බැලිය හැකි බව ද ඔහු කියා ඇතැයි දැනගන්නට තිබේ.

මෙම සියලු තත්වයන් හරහා පැහැදිළි වන එක් සත්‍යයක් තිබේ. එනම් අපේ මව් රටේ බංකොලොත් දේශපාලනය විසින් ජනප්‍රිය ක්‍රීඩකයන්ගේ නම හරහා තම දේශපාලන ප්‍රතිරූපය ගොඩ නඟා ගැනීමේ උත්සාහයක් ආරම්භ කර ඇති බවයි. මෙය හරි හෝ වැරදි යයි පෙන්වා දීමට හෝ එය වැළැක්වීමට හෝ විවේචනය කිරීමට හෝ අපට වුවමනාවක් නැත. එහෙත්, ඉහත සඳහන් කළ චරිත සියල්ලම අපේ මව් බිමේ සම්පත්ය.

අපේ රටේ ඇති විවිධ ක්ෂේත්‍රවලට සම්බන්ධ සම්පත් අතුරින් ක්‍රීඩා ක්ෂේත්‍රය සතු සම්පත්ය. මෙම සම්පත් යොදා ගත යුත්තේ අපේ අනාගත ක්‍රීඩාව ගොඩ නැඟීම සඳහා ය. දියුණු කිරීම සඳහා ය. බංකොලොත් දේශපාලනය නඟා සිටුවීම සඳහා ඔවුන් ගැලපෙන්නේ නැත. එසේ යොදා ගැනීමට ඉඩ දිය යුතු ද නැත. එය කිරීම සඳහා මුල් විය යුත්තේ දේශපාලනය ය. එහෙත් දේශපාලන ක්ෂේත්‍රයේ අදබාලයන්ට එහි ඇති වටිනාකමක් පෙනෙන්නේ නැත. ක්‍රීඩකයයෝ ද දේශපාලනයන්ගේ ඉච්ඡා බස්වලට රැවටී හෝ වෙනත් කවර හෝ හේතුවක් නිසා හෝ තමන්ගේ විනාශය කරා මඟ පාදන මෙම දේශපාලන නරා වළට ඇද වැටෙමින් සිටිති. එබැවින්, මෙම තත්වය වෙනස් කිරීම සඳහා සමාජ කතිකාවතක් ඇරඹිය යුතු ව තිබේ. එය ඇරඹීමේ වගකීම ඇත්තේ ක්‍රීඩකයන් වෙනුවෙන් 'චියර්' කළ ක්‍රීඩාලෝලී අපට මිස අන් කාටවත් නොවේ.

ලාංකික ක්‍රීඩකයන්ගෙන් ක්‍රිකට් ඇකඩමියක්

ශ්‍රී ලංකා ටෙස්ට් පිළේ හිටපු උපනායක රවි රත්නායක, හිටපු ටෙස්ට් ක්‍රීඩක සන්ජීව වීරසිංහ හා හිටපු අන්තර්ජාතික ක්‍රීඩක මංජුල මුණසිංහ එක්ව ඔස් ලංකා ක්‍රිකට් ඇකඩමි නමින් ක්‍රිකට් ඇකඩමියක් ආරම්භ කර ඇත.

වයස අවුරුදු 8 සිට ඉහළ ක්‍රීඩකයන් පිහුණු කිරීම තම අරමුණ බව ඇකඩමිය පිළිබඳව සන්නස හා කතා කළ මංජුල මුණසිංහ පැවසුවේ ය. පන්දු යැවීම, පන්දුවට පහර දීම, පන්දු රැකීම කඩුළු අතර දිවීම, කඩුළු රැකීම ඇතුළු ක්‍රිකට් ක්‍රීඩාවේ සියුළුම ක්ෂෙත්‍රයන් තමන් ආවරණය කරන බව ඔහු කීවේය. මේ ෂඳහා වීඩියෝ විශ්ලේෂණය වැනි සියළුම නව තාක්ෂණික අපක්‍රම තමන් යොදා ගන්නා බවද ඔහු පැවසුවේය.

මුල් පෙළේ ක්‍රිකට් තරග 50 කට වඩා සහභාගිවී ඇති මංජුල ඔස්ට්‍රේලියානු ක්‍රිකට් මණ්ඩලයේ අනුමැතිය ලද ක්‍රිකට් පුහුණු කරුවෙකි. හිටපු ටෙස්ට් උපනායකයකු වන රවි රත්නායක ටෙස්ට් තරග 22 කට හා එක් දින තරග 78 ක් ඇතුලු ව මුල් පෙළේ තරග 159 කට සහභාගි වී ඇත. ඔහු ක්‍රිකට් පුහුණු කිරීම පිළිබඳව එංගලන්තයෙන් සහතික ලද පුහුණු කරුවෙක් ද වෙයි. ශ්‍රී ලංකාව වෙනුවෙන් ටෙස්ට් වරම් ලද ලාබාලම ක්‍රීඩකයා වන සංජීව වීරසිංහ මුල් පෙලේ තරග 45 කට සහභාගි වූ ක්‍රීඩකයෙකි. ඔහු ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මන්ඩලය විසින් අන්මැතිය ලද ක්‍රිකට් පුහුණු කරුවෙකි.

ඔස් ලංකා ක්‍රිකට් ඇකඩමිය පිලිබඳ වැඩි විස්තර ලබා ගැනීමට දුකථන අංක 0401 559 114 හෝ 03 9702 8104 අමතන්න.

මේ ශ්‍රී ලාංකික ක්‍රීඩකයන්ගේ උත්සාහය සාර්ථක වන ලෙස සන්නස සුබ පතයි.

NOEL AIRCON PTY LTD
නොයෙල් එයා කොන්
PANASDSONIC
TOSHIBA
KELVINATOR
ELECTRLUX
Any type
ඕනෑම වර්ගයක වායු සමීකරණ යන්ත්‍ර
වගකීමක් සහිතව සවිකර දෙනු ලැබේ.
ඉතා සාධාරණ අයකිරීම්.
We beat any price
ව්‍යාපාරික මහතුනි,
ඔබේ වෙළඳ සලට, ආපන ශාලාවට අවශ්‍ය
Cool Rooms හා Freezer Rooms
ඉතා අනර්ඝ ලෙස අපි සාදා නිම කර දෙන්නෙමු.
Installation of
Wall Mounted Split Units
Ceiling Cassete typr
Convertible Type
Recondition of Cool Rooms/Freezer Rooms
Service & Repair
නිමාවෙන් පසු වගකීම.
අමතන්න
නොයෙල් 0411 112 990
Ph/Fax 03 9774 8991 AH 03 9774 8991
email sue05@ozemail.com.au